# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1994 අංක 16 දරන
## ශ්‍රී ලංකාවේ මරීය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 ජුනි මස 20 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1994 ජුනි මස 24 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

**කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.**

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1994 අංක 16 දරන ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 49/92

**ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ක්‍රිස්තියානි පාසල් සහ රජයේ ආධාර ලබන හෝ රජය විසින් නඩත්තු කරනු ලබන වෙනත් පාසල් පිහිටුවීම සහ පවත්වාගෙන යාම මගින් ක්‍රිස්තියානි ආගම පිළිබඳ දැනුම පතුරුවා හැරීමේත් අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණුව ලබාදීමේත් කාර්ය උදෙසා ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන් පර්ෂදයක් වශයෙන් ප්‍රතිෂ්ඨාපනය වී ඇති හෙයින් ද : **පූර්විකාව.**

ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා සංස්ථාගත කිරීම මගින් පූර්වෝක්ත කාර්ය වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම, අඛණ්ඩව කරගෙන යාම සහ මුදුන් පමුණුවා ගැනීම අවශ්‍ය වී ඇති හෙයින් ද :

පූර්වෝක්ත ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා සංස්ථාගත කිරීම යෝග්‍ය ව ඇති හෙයින් ද:

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1994 අංක 16 දරන ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා වන අතිගරු උස්වත්තෙ ලියනගේ ජෝන් ක්ලිපර්ඩ් ජයන්ත පෙරේරා සොහොයුරා සහ රෝමානු කතෝලික පල්ලියේ නීතිවලට සහ ව්‍යවහාරයන්ට අනුකූලව යථා පරිදි ඔහුගේ ධුරයට පත් කරනු ලබන ඔහුගේ ඒ ඒ අනුප්‍රාප්තිකයන් "මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේය. තවද සෑම වර්ගයකම චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමට, මිලට ගැනීමට, දැරීමට සහ භුක්ති විඳීමටත් ඒ දේපළ විකිණීමට හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමටත් පූර්ණ බලය ඒ සංස්ථාවට ඇති අතර, එකී දේපළ සම්බන්ධයෙන් එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. **ශ්‍රී ලංකාවේ මරිය සොහොයුරන්ගේ ප්‍රාදේශීය සොහොයුරා සංස්ථාගත කිරීම.**

**3.** ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ක්‍රිස්තියානි පාසල් සහ රජයේ ආධාර ලබන හෝ රජය විසින් නඩත්තු කරනු ලබන වෙනත් පාසල් පිහිටුවීම සහ පවත්වාගෙන යාම මගින් ක්‍රිස්තියානි ආගම පිළිබඳ දැනුම පතුරුවා හැරීමත්, අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණුව ලබාදීමෙහිලා යෙදීමත් සංස්ථාවේ පරමාර්ථ වන්නේය. **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

2—ඩී 023134—5,380 (92/06)

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

4. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්වෙතින් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.